

කාර්යසාධන වාර්තාව - 2022

වැය ශීර්ෂ අංකය :238

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
කොළඹ 01

පටුන

1.0 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 4

1.1 හැඳින්වීම 4

1.2 දැක්ම සහ මෙහෙවර 4

1.3 අරමුණු හා කාර්යයන් 4

1.4 සංවිධාන සටහන 5

2.0 ප්‍රගතිය, අභියෝග සහ ඉලක්ක 6

2.1 රජයේ ආදායම් කාර්යසාධනය 6

2.1.1 බදු ආදායම 7

ආදායම් බදු 8

එකතු කළ අගය මත බදු 9

නිෂ්පාදන /සුරා බද්ද 10

වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද 11

වෙළඳ භාණ්ඩ අපනයන සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වන බද්ද (සෙස් බද්ද) 11

වෙනත් බදු 12

2.1.2 බදු නොවන ආදායම 12

3.0 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය 20

3.1 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය 20

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 21

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 22

3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 23

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 28

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 28

3.7 මු.රෙ. 208 අනුව මෙම දෙපාර්තමේන්තුව ලද ප්‍රතිපාදන සහ වියදම් ප්‍රගතිය 28

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 29

3.9 විගණකාධිපතිගේ වාර්තාව 30

4.0 කාර්යසාධන දර්ශක 37

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 37

5.0 සාක්ෂාත් කරගත හැකි තිරසර සංවර්ධන ඉලක්කවල කාර්යසාධනය (SDGs) 40

5.1.හඳුනාගත් අදාල තිරසර සංවර්ධන අරමුණු 40

5.2 තිරසර සංවර්ධන අරමුණුවල සපුරා ගැනීම සහ අභියෝග (SDGs) 40

6.0 මානව සම්පත් පැතිකඩ 40

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 40

6.2 කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය 41

6.3 මානව සම්පත් සංවර්ධනය 41

6.3.1 දේශීය පුහුණු 41

6.3.2 විදේශ පුහුණු 42

7.0 අනුකූලතා වාර්තාව 43

වගු

1 වගුව:රාජ්‍ය ආදායමේ සාරාංශය 6

2 වගුව: එකතු කළ අගය මත බදු ආදායම 9

3 වගුව: නිෂ්පාදන සුරා බදු ආදායම 10

4 වගුව: බදු නොවන ආදායම 13

5 වගුව: ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග - 2022 වසෙර් ජනවාරි සිට -2023 අප්‍රේල් 13

රූප සටහන්

1 රූප සටහන : බදු ආදායමේ සංයුතිය 2022 8
2 රූප සටහන : දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන බදු ආදායම 11
3 රූප සටහන : මත්පැන් නිෂ්පාදනය සහ සුරාබදු ආදායම 11

1.0 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූලික වගකීම වනුයේ අපේක්ෂිත ආර්ථික හා සමාජයීය අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අදාළ ආයතන, රේඛීය අමාත්‍යාංශ සහ පෞද්ගලික අංශය සමඟ මනා සම්බන්ධීකරණයෙන් යුතුව රජයේ පුළුල් සංවර්ධන රාමුව තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමයි.

රටේ බදු ප්‍රතිපත්තිය සැකසීම මෙන්ම ආදායම්, වියදම් සහ මූල්‍ය විශ්ලේෂණය හා දේශීය සහ විදේශීය සාර්ව ආර්ථික ප්‍රවණතා විශ්ලේෂණය තුළින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි සුදුසු පරිදි වෙනස්කම් සිදුකිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමයි.

1.2 දැක්ම සහ මෙහෙවර

දැක්ම

"තිරසර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ස්ථාපිත වීම සහතික කිරීම"

මෙහෙවර

"රජයේ පුළුල් සංවර්ධන රාමුව තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම"

1.3 අරමුණු සහ කාර්යයන්

- පෞද්ගලික, රාජ්‍ය සහ ජාත්‍යන්තර නියෝජිතයන් සම්බන්ධීකරණය කරමින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ මධ්‍යකාලීන මූල්‍ය රාමුව සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- තීරුබදු සහ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද හැර බදු ප්‍රතිපත්ති සහ ඊට අදාළ අනෙකුත් අණපනත් සම්පාදනය කිරීම.
- ආදායම් රැස්කරන සියළුම දෙපාර්තමේන්තු සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් රාජ්‍ය ආදායම සහ ලැබීම් ඇතුළත්ව රාජ්‍ය මූල්‍ය පෙළගැස්ම සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය කළමනාකරණය සහ නිරීක්ෂණය කිරීම.
- ආදායම් රැස්කරන දෙපාර්තමේන්තු හා ජාතික අයවැය සහ මූල්‍ය ක්‍රියාත්මක කරන දෙපාර්තමේන්තු සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම.
- රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට අනුව නීතිමය සංශෝධන කිරීමට අදාළ කටයුතු ක්‍රියාවට නැංවීම.
- සියලුම වාර්තාකරණයන් ඇතුළත්ව 2003 අංක 03 දරන දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ක්‍රියාත්මක කිරීම.
- සාර්ව ආර්ථික ඒකකයේ සහාය ඇතිව විවිධ රාජ්‍ය මූල්‍ය සහ සාර්ව ආර්ථික ක්‍රියා විශ්ලේෂණය සහ පර්යේෂණ සිදුකිරීම, අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම, පනත් සංශෝධනය හා ගැසට් නිවේදන පිළියෙල කිරීම.

1.4 සංවිධාන සටහන



අතිරේක අ.ජ.	- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
නි.අ.	- නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අ.	- සහකාර අධ්‍යක්ෂ
ප.නි.	- පරිපාලන නිලධාරී
භා.ප.	- භාෂා පරිවර්තක
සං.නි.	- සංවර්ධන නිලධාරී
ප්‍ර.ක.සේ.නි.	- ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ක.සේ.නි.	- කළමනාකරණ සේවා නිලධාරී
කා.කා.ස.	- කාර්යාල කාර්ය සහායක

2.0 ප්‍රගතිය, අභියෝග සහ ඉලක්ක

2.1 රජයේ ආදායම් කාර්යසාධනය

ප්‍රදානයන් ද ඇතුළුව සමස්ත රාජ්‍ය ආදායම, 2021 වසරේ දී රු. බිලියන 1,463.8 සිට 2022 වසරේ දී රු. බිලියන 2,012.6 දක්වා සියයට 37.5 කින් සැලකිය යුතු ඉහළ ගොස් ඇත. සෘජු හා වක්‍ර බදු අනුපාත සැලකිමේදී එය, 2021 වසරේ දී 23:77 සිට 2022 වසරේ දී 30:70 දක්වා කැපී පෙනෙන ප්‍රගතියක් වාර්තා කර ඇත. එකතුකළ අගය මත බදු සහ සංස්ථාපිත ආදායම් බදුවල ආදායම් රැස් කිරීම වැඩි වීම මෙන්ම අධිභාර බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලැබූ ආදායම් ප්‍රතිලාභ හේතුවෙන් 2021 වසරේ දී රු. බිලියන 1,298 ක් වූ සමස්ත බදු ආදායම 2022 වසරේ දී රු. බිලියන 1,751 ක් දක්වා සියයට 34.9 කින් සැලකිය යුතු ලෙස ඉහල ගියේය. බලපත්‍ර ගාස්තු තාර්කීකරණය කිරීමත් 2022 වසරේ රජයේ ගාස්තු ඉහල නැංවීමත් මූලික කරගත් ගාස්තු සහ අයකිරීම් මගින් ලැබූ ආදායම හේතු කොට ගෙන බදු නොවන ආදායම 2021 වසරේ රු. බිලියන 159 ට සාපේක්ෂව 2022 වසරේ රු. බිලියන 228 දක්වා සියයට 43.4 කින් වර්ධනය විය.

ප්‍රධාන වශයෙන් දේශීයව එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම සියයට 57.2 කින් ද සුරාබද්දෙන් ලද ආදායම සියයට 19.2 කින් ද ඉහළ යාම හේතුවෙන් දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු ආදායම 2021 වසරේ දී රු. බිලියන 419.3 ට සාපේක්ෂව 2022 වසරේ දී රු. බිලියන 590.3 දක්වා සියයට 40.8 කින් ඉහළ ගියේය. ආනයන මත වූ එකතු කළ අගය මත බද්ද සහ වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් ලද ආදායම ඉහළ යාම හේතුවෙන් ආනයන මත පදනම් වූ බදු ආදායම 2021 වසරේ දී රු. බිලියන 546.1 සිට 2022 වසරේ දී රු. බිලියන 593.0 දක්වා සියයට 8.6 කින් වර්ධනය විය. ආනයන පැසෙහි ඇති මෝටර් වාහන සහ අනෙකුත් සුඛෝපභෝගී භාණ්ඩ වැනි ආනයන සඳහා පනවා ඇති සීමාවන් අබණ්ඩව ක්‍රියාත්මක වීම හේතුවෙන් විදේශ වෙළෙඳාම මත වන බදු මඟින් ලද ආදායම 2021 වසරේ දී රු. බිලියන 349.8 සිට 2022 වසරේ දී රු. බිලියන 341.1 දක්වා සියයට 2.5 කින් අඩු විය. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද සහ ආනයනබදු වලින් උපයන ලද ආදායම 2022 වසරේ දී පිළිවෙලින් රු.බිලියන 40.2 දක්වා සියයට 28.0 කින් සහ රු.බිලියන 50.0 දක්වා සියයට 22.3 කින් අඩු විය.

1 වගුව | **රාජ්‍ය ආදායම් සාරාංශය** රු.මිලියන

අයිතමය	2019	2020	2021	2022(අ)
මුළු ආදායම සහ ප්‍රදාන	**1,898,808**	**1,373,308**	**1,463,810**	**2,012,589**
මුළු ආදායම	**1,890,899**	**1,367,960**	**1,457,071**	**1,979,184**
බදු ආදායම	1,734,925	1,216,542	1,298,019	1,751,132
ආදායම් බදු	427,700	268,249	302,115	534,021
භාණ්ඩ හා සේවා මත බදු	975,557	586,650	646,068	875,995
විදේශ වෙළෙඳාම මත බදු	331,668	361,643	349,836	341,116
බදු නොවන ආදායම්	155,974	151,417	159,052	228,052
ප්‍රදාන	**7,909**	**5,348**	**6,740**	**33,405**
ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස				
ආදායම සහ ප්‍රදාන	**11.9**	**8.8**	**8.3**	**8.3**
මුළු ආදායම	**11.9**	**8.7**	**8.3**	**8.2**
බදු ආදායම	10.9	7.8	7.4	7.3
බදු නොවන ආදායම්	1.0	1.0	0.9	0.9
ප්‍රදාන	**0.0**	**0.0**	**0.0**	**0.1**

මූලාශ්‍රය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

2.1.1 බදු ආදායම

බදු ආදායමෙහි නාමික අගය 2021 වසරේ දී රු. බිලියන 1,298.0 සිට 2022 වසරේ දී රු. බිලියන 1,751.1 දක්වා වැඩි විය. බදු ආදායම ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස 2021 වසරේ දී සියයට 7.4 සිට 2022 වසරේ දී සියයට 7.3 දක්වා ප්‍රතිශතාංක 0.1 කින් අඩු විය. සමස්ත ආදායමට බදු ආදායම දක්වන දායකත්වය ද 2021 වසරේ දී සියයට 89.1 සිට 2022 වසරේ දී සියයට 88.5 දක්වා සුළු වශයෙන් අඩු විය. එක් වරක් පමණක් අය කරනු ලබන අධිභාර බද්දෙන් සහ සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදුවලින් ඉහළ ආදායමක් එකතු කිරීමේ බලපෑම පිළිබිඹු කරමින් ආදායම් බද්දෙන් ලද ආදායම 2021 වසරේ දී රු. බිලියන 302.1 සිට 2022 වසරේ දී රු. බිලියන 534.0 ක් ලෙස සියයට 76.8 කින් කැපීපෙනෙන ලෙස වැඩි විය. නිෂ්පාදන බද්දෙන් ලද ආදායම රු. බිලියන 342.5 දක්වා සියයට 11.6 කින් සහ එකතු කල අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 463.0 දක්වා සියයට 50.2 කින් ද ඉහළ යාම හේතුවෙන් භාණ්ඩ හා සේවා මත බදු ආදායම 2021 වසරේ දී රු. බිලියන 646 සිට 2022 වසරේ දී රු. බිලියන 876 තෙක් සියයට 35.6 කින් වැඩි විය. කෙසේ වුවද, 2022 වසරේ දී විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද රු. බිලියන 40.2 දක්වා සියයට 28 කින් සහ රේගු ආනයන බද්ද රු. බිලියන 50.0 දක්වා සියයට 22.3 කින් සැලකිය යුතු ලෙස අඩුවීම හේතුවෙන් විදේශ වෙළෙඳාම මත බදුවලින් එකතු කරන ලද ආදායම 2021 වසරේ දී රු. බිලියන 349.8 සිට 2022 වසරේ දී රු. බිලියන 341.1 දක්වා සියයට 2.5 කින් අඩු විය.

රූපසටහන 2.1 | බදු ආදායමේ සංයුතිය- 2022



ආදායම් බදු

සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන බදු, අධිභාර බද්ද, පොළී මත බදු සහ ප්‍රාග්ධන ලාභ බද්දෙන් ලැබෙන ආදායමෙහි වැඩිවීමත් සමඟ ආදායම් බදුවලින් ලැබෙන මුළු ආදායම 2022 වසරේ දී රු. බිලියන 534.0 සිට 2021 වසරේ දී රු. බිලියන 302.1 දක්වා සියයට 76.8 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. ආදායම් බද්ද මඟින් ලද ආදායම ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2021 වසරේ දී සියයට 1.7 සිට 2022 වසරේ දී සියයට 2.2 දක්වා වැඩි විය. ආදායම් බද්දෙන් ලැබෙන ආදායම සමස්ත බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස 2021 වසරේ දී සියයට 23.3 සිට 2022 වසරේ දී සියයට 30.5 දක්වා වැඩි විය. 2022 වසරේ දී ආදායම් බද්දෙන් ලද ආදායම එහි ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 95.7 ක් විය. සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන බදු ආදායම 2021 වසරේ දී රු. බිලියන 272.8 සිට 2022 වසරේ දී රු. බිලියන 358.5 දක්වා සියයට 31.4 කින් වැඩි විය. අධිභාර බද්ද පැනවීම මඟින් ලද රු. බිලියන 120.7 ක අතිරේක ආදායම හේතුවෙන් සංස්ථාපිත ආදායම් බද්ද රු. බිලියන 464.4 දක්වා සියයට 83.8 කින් වැඩි විය. පුද්ගලික අංශයේ වැටුප් වර්ධක හේතුවෙන් උපයන විට ගෙවීම් බදු/ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම 2021 වසරේ දී රු. බිලියන 15.4 සිට 2022 වසරේ දී රු. බිලියන 25.5 දක්වා සියයට 66.4 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. පොළී මත බද්දෙන් ලද ආදායම 2021 වසරේ දී රු. බිලියන 12.4 සිට 2022 වසරේ දී රු. බිලියන 19.8 දක්වා සියයට 59.9 දක්වා සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, ප්‍රාග්ධන ලාභ බද්දෙන් ලද ආදායම 2021 වසරේ දී රු. බිලියන 0.7 සිට 2022 වසරේ දී රු. බිලියන 5.3 දක්වා වැඩි විය. මේ අතර, 2021 වසරේ සැප්තැම්බර් මස 15 වැනි දින සිට 2022 වසරේ මාර්තු මස 31 වැනි දින දක්වා දේශීය හා විදේශීය

වශයෙන් හෙළිදරව් නොකරන ලද මුදල් හා දේපළවල ආයෝජනය කරන ලද වටිනාකම මත සියයට 1.0 ක අනුපාතය යටතේ පනවන ලද, ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්දෙන් 2022 වසරේ දී රු. බිලියන 4.0 ක ආදායමක් උපයන ලදී.

එකතු කළ අගය මත බද්ද (VAT)

මූල්‍ය සේවා සඳහා වන එකතු කළ අගය මත වන බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා ත් එකතු කළ අගය මත සම්මත බදු අනුපාතය සියයට 8 සිට සියයට 15 දක්වා ත් වැඩි කිරීම හේතුවෙන් එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම නාමික වශයෙන් 2021 වසරේ දී රු. බිලියන 308 සිට 2022 වසරේ දී රු. බිලියන 463 දක්වා සියයට 50.2 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. 2022 වසරේ දී දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බද්දෙන් ලැබූ ආදායම රු. බිලියන 291.6 ක් දක්වා සියයට 57.2 කින් වැඩි වූ අතර ආනයනවලින් ලද එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 171 ක් දක්වා සියයට 39.7 කින් වැඩි විය. කෙසේ වෙතත්, එකතු කළ අගය මත බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 86.9 ක් ලෙස පහළ අගයක් ගත් අතර, විදේශ විනිමය හිඟය සහ ආනයන සීමා කිරීම් අඛණ්ඩව පැවතීම හේතුවෙන් ආනයන අඩුවීමෙන් ආනයනයවලින් ලද එකතු කළ අගය මත බදු ආදායම අපේක්ෂිත ආදායමට වඩා අඩු විය. එකතු කළ අගය මත බදු ආදායම සමස්ත බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස 2021 වසරේ දී සියයට 23.7 සිට 2022 වසරේ දී සියයට 26.4 දක්වා වැඩි වූ අතර ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2021 වසරේ දී සියයට 1.8 සිට 2022 වසරේ දී සියයට 1.9 දක්වා වැඩි විය.

2 වගුව | එකතු කළ අගය මත බදු ආදායම

රු.මිලියන

අයිතමය	2017	2018	2019	2020	2021	2022(අ)
දේශීය	276,065	283,327	275,089	150,823	185,918	292,293
ආනයන	168,394	179,163	169,914	85,727	122,766	171,478
දළ ආදායම	**444,459**	**462,490**	**445,003**	**236,550**	**308,684**	**463,771**
ආපසු ගෙවීම	720	840	1,126	2,764	471	699
ශුද්ධ ආදායම	**443,739**	**461,651**	**443,877**	**233,786**	**308,213**	**463,072**
ශුද්ධ ආදායම ද.දේ.නි.% ලෙස	**3.3**	**3.2**	**3.0**	**1.6**	**1.8**	**1.9**

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

නිෂ්පාදන/ සුරා බද්ද

ප්‍රධාන වශයෙන් ආරක්ෂිත සලකුණු හා ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධතිය මුළුමනින්ම ක්‍රියාත්මක කිරීමත්, 2021 වසරේ නොවැම්බර් මාසයේ දී මධ්‍යසාර සහ දුම්වැටි සඳහා අදාළ බදු අනුපාත සංශෝධනය කිරීමත් හේතුවෙන් නිෂ්පාදන/ සුරා බදු ආදායම කැපී පෙනෙන ලෙස නාමික වශයෙන් ඉහළ ගියේය. කෙසේ වෙතත්, ආනයන සීමා කිරීම් සහ සැපයුම් අංශයේ බාධාවන් හේතුවෙන් ප්‍රධාන වශයෙන් මෝටර් වාහන, ඛනිජ තෙල් නිෂ්පාදන සහ අනෙකුත් නිෂ්පාදන භාණ්ඩ ආනයනයෙන් ලද ආදායම 2022 වසරේ දී අඩු විය.

ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස නිෂ්පාදන/ සුරා බදුවලින් ලද ආදායම 2021 වසරේ දී සියයට 1.7 සිට 2022 වසරේ දී සියයට 1.4 දක්වා අඩු වූ අතර එය ජාත්‍යන්තර සාමාන්‍යය අගය වන ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 4-5 ට ත් වඩා බෙහෙවින් අඩු අගයක් වෙමින් එය නිෂ්පාදන/ සුරාබදු ආදායම තවදුරටත් ඉහළ නැංවීමේ දැඩි අවශ්‍යතාවය පිළිබිඹු කරයි. එමෙන්ම, නාමික වශයෙන් ගත් කළ නිෂ්පාදන/සුරා බදු ආදායම 2021 වසරේ දී රු. බිලියන 306.9 සිට 2022 වසරේ දී රු. බිලියන 342.5 ක් දක්වා සියයට 11.6 කින් කැපී පෙනෙන ලෙස වැඩි විය. තවද, සමස්ත බදු ආදායමට නිෂ්පාදන/ සුරා බදු ආදායමේ දායකත්වය 2021 වසරේ දී සියයට 23.6 සිට 2022 වසරේ දී සියයට 19.6 දක්වා අඩු විය. නිෂ්පාදන/ සුරා බදුවලින් ලැබෙන ආදායම වසර ගණනාවක් පුරා රාජ්‍ය ආදායමේ ප්‍රධාන ප්‍රභවයන්ගෙන් එකක් විය. සුරා බදු මඟින් එකතු කරන ලද ආදායම 2022 වසරේ දී සංශෝධිත ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 91.6 ක් විය.

3 වගුව | නිෂ්පාදන සුරා බදු ආදායම

රු.මිලියන

අයිතමය	2017	2018	2019	2020	2021(අ)	2022	වෙනස 2021/2022
මත්පැන්	113,684	113,944	115,443	120,990	138,637	165,188	19.2
දුම්වැටි	85,956	92,198	87,367	94,345	88,539	104,160	17.6
මෝටර් වාහන	189,740	204,081	130,378	48,760	18,113	14,504	(19.9)
ඛනිජ තෙල් නිෂ්පාදන	73,983	66,318	61,740	53,111	55,339	53,074	(4.1)
අනෙකුත්	6,091	7,701	4,549	4,727	6,234	5,598	(10.2)
එකතුව	**469,454**	**484,242**	**399,478**	**321,932**	**306,861**	**342,523**	**11.6**

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

රූපසටහන 2 | දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන බදු ආදායම



රූපසටහන 3 | මත්පැන් හා දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන/ සුරාබදු ආදායම



මූලාශ්‍ර : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව

වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද (PAL)

වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් උපයාගත් ආදායම 2021 වසරේ දී රු. බිලියන 154.1 සිට 2022 වසරේ දී රු. බිලියන 180.6 දක්වා සියයට 17.2 කින් කැපී පෙනෙන ලෙස වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඔටෝ ඩීසල්, පෙට්‍රල් (ඔක්ටේන් 92), යූරියා, තිරිඟු පිටි සහ තිරිඟු ඇට වැනි ප්‍රධාන ආනයන ද්‍රව්‍යවලින් ලැබූ ආදායම ඉහළ යාමත් මෙම වසර තුල ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ බලපෑමත්ය. 2022 වසරේ දී වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද මඟින් ලද ආදායම එහි සංශෝධිත ඇස්තමේන්තුව වන රු. බිලියන 177 න් සියයට 102 ක් විය.

වෙළඳ භාණ්ඩ අපනයන සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වන බද්ද (සෙස් බද්ද)

අත්‍යාවශ්‍ය නොවන ආනයන සීමා කිරීම සඳහා රජය ගෙන ඇති ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ තෝරාගත් ආනයන සඳහා ආන්තික තැන්පතු අවශ්‍යතා පැනවීම හේතුවෙන් ඇති වූ ආනයන පහත වැටීමෙන්, ආනයන හා අපනයන යන දෙඅංශයෙන්ම සෙස් බද්දෙන් ලද ආදායම 2021 වසරේ දී රු. බිලියන 75.5 ට සාපේක්ෂව 2022 වසරේ දී රු. බිලියන 70.3 දක්වා සියයට 6.9 කින් අඩු විය. ඒ අනුව, ආනයන මත සෙස් බද්දෙන් ලද ආදායම 2021 වසරේ දී රු. බිලියන 73.3 සිට 2022 වසරේ දී රු. බිලියන 68.1 දක්වා සියයට 6.9 කින් අඩු විය. ලිහිසි තෙල් සකස් කිරීම සඳහා භාවිතා කරන ලිහිසිකාරක තෙල් (බේස් ඔයිල්) ආනයනය 2022 වසරේ දී ආනයන මත සෙස් ආදායමට විශාලතම දායකත්වය සපයන ලදී. මීට අමතරව, බීඩි කොළ, ටයර්, වියන ලද රෙදි සහ පෝට්ලන්ඩ් සිමෙන්ති මත වූ සෙස් බද්ද, සෙස් බද්ද සඳහා වූ අනෙකුත් ප්‍රධාන ආදායම් මාර්ග විය. අපනයන මත සෙස් බදු ආදායම 2021 වසරේ දී රු. බිලියන 2.22 සිට 2022 වසරේ දී රු. බිලියන 2.24 දක්වා සුළු වශයෙන්

වැඩි විය. ඉහළම අපනයන සෙස් ආදායම උපයාගත් නිෂ්පාදන වූයේ තේ, ඉල්මනයිට්, පොල්, ග්‍රැනයිට් සහ පේල් ක්‍රේප් රබර් ය. 2022 වසරේ දී සෙස් බදු ආදායම එහි සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම වූ රු. බිලියන 68 න් සියයට 103.4 ක් විය.

වෙනත් බදු

විදුලි සංදේශ බද්ද : විදුලි සංදේශ බද්දෙන් උපයන ලද ආදායම 2021 වසරේ දී රු. බිලියන 12.8 සිට 2022 වසරේ දී රු. බිලියන 15.0 දක්වා සියයට 16.8 කින් මධ්‍යස්ත ලෙස වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2022 වසරේ ජූනි මාසයේ දී විදුලි සංදේශ බද්ද සියයට 11.25 සිට සියයට 15 දක්වා ඉහළ දැමීමත් විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් පැවතීම හේතුවෙන් අන්තර්ජාල සේවා භාවිතය ඉහළ යාම සහ එමඟින් විදුලි සංදේශ සේවා සමස්තයක් ලෙස වැඩිවීමය.

අපගමන බද්ද කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පනවා තිබූ සංචරණ සීමාවන් ඉවත් කිරීමත් සමඟ ජාත්‍යන්තර ගමනාගමනය වැඩිවීම මෙන්ම ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ ධනාත්මක බලපෑමෙන් ප්‍රතිලාභ ලබමින් අපගමන බදු ආදායම 2021 වසරේ දී රු. බිලියන 3.3 සිට 2022 වසරේ දී රු. බිලියන 22.2 දක්වා සියයට 570 කින් සැළකිය යුතු ලෙස වැඩි විය.

ඔට්ටු ඇල්ලීම සහ සූදු බද්ද : සංචාරක ක්ෂේත්‍රය හා සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිත ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම මඟින් ප්‍රතිලාභ ලබමින් ඔට්ටු ඇල්ලීමේ සහ සූදු බද්දෙන් ලද ආදායම 2021 වසරේ දී රු. බිලියන 1.9 සිට 2022 වසරේ දී රු. බිලියන 5.2 දක්වා සියයට 170.5 කින් සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. මෙම කර්මාන්තය විධිමත් කිරීම සඳහා 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය) පනත යටතේ කැසිනෝ ක්‍රියාකරුවන් ලියාපදිංචි කිරීම අනිවාර්යය කරමින් ගැසට් නිවේදන ද නිකුත් කරන ලදී.

2.1.2 බදු නොවන ආදායම

බොහොමයක් සේවා ගාස්තු ඉහළ නැංවෙන පරිදි සංශෝධනය කිරීම හේතුවෙන් 2021 වසරේ දී රු. බිලියන 43.4 සිට 2022 වසරේ දී රු. බිලියන 90 දක්වා සේවා හා ගාස්තු මඟින් ලද ආදායම සියයට 111.2 කින් සැලකිය යුතු ලෙස ඉහළ යාම ආදායම් එකතු කිරීමේ වැඩිවීම පිළිබිඹු කරන අතර මේ හේතුවෙන් බදු නොවන ආදායම 2021 වසරේ දී රු. බිලියන 159 සිට 2022 වසරේ දී රු. බිලියන 228.1 දක්වා සියයට 43.4 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. කෙසේ වෙතත්, බදු නොවන ආදායම ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2022 වසරේ දී සියයට 0.9 ක් ලෙස නොවෙනස්ව පැවතුණි.

කුලී ආදායමෙන් සහ පොලී ආදායමෙන් ලැබූ බදු නොවන ආදායම් 2021 වසරේ දී රු. බිලියන 11.6 සිට 2022 වසරේ දී රු. බිලියන 13.2 දක්වා සියයට 14.1 කින් වැඩි විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ පැවරුම් මඟින් ලද ආදායම 2021 වසරේ දී රු. බිලියන 15.0 ට සාපේක්ෂව 2022 වසරේ දී රු. බිලියන 30 ක් දක්වා වැඩි විය. සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම 2021 වසරේ දී රු. බිලියන 34.6 සිට 2022 වසරේ දී රු. බිලියන 37.4 දක්වා සියයට 8.1 කින් වැඩි විය. භාණ්ඩාගාර

බැඳුම්කර වාරිකවලින් ලැබූ ආදායම ඇතුළු අනෙකුත් බදු නොවන ආදායම් 2021 වසරේ දී රු. බිලියන 24.6 සිට 2022 වසරේ දී රු. බිලියන 29.3 දක්වා සියයට 19 කින් වැඩි විය.

4 වගුව I බදු නොවන ආදායම

රු.මිලියන

අයිතමය	2016	2017	2018	2019	2020	2021 (අ)	2020/ 2021 (ප්‍රතිශත වෙනස)	2021 (සමස්ත බදු නොවන ආදායමේ %ක් ලෙස)
පොළී/කුලී	15,806	11,845	13,731	18,547	19,351	11,556	-40.3	7.3
ලාභ සහ ලාභාංශ	108,160	53,998	41,828	27,857	17,624	30,591	73.6	19.2
විකුණුම් සහ ගාස්තු	72,606	66,575	105,202	73,884	47,370	42,645	-10.0	26.8
සමාජ ආරක්ෂණ දායක මුදල්	18,046	22,940	25,214	28,985	32,417	34,619	6.8	21.8
මහා බැංකු ලාභ පැවරීම	5,000	-	15,000	-	24,009	15,012	-37.5	9.4
අනෙකුත්	2,754	5,995	6,681	6,701	10,646	24,630	131.4	15.5
එකතුව	**222,372**	**161,353**	**207,656**	**155,974**	**151,417**	**159,052**	**5.0**	**100.0**

මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

2022 වසෙර් ජනවාරි සිට -2023 අප්‍රේල් දක්වා ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)	
2022.01.01	සුරාබදු නිවේදන අංක 01/2022 (2022.01.01 දිනැති අංක 2260/78 දරන ගැසට් නිවේදනය) - තරු 03 හා තරු 04 හෝටල් සහ තරු 05 හා ඊට ඉහළ ගණයේ හෝටල්/ බුටික් හෝටල්/ බුටික් විලා පෞරාණික වැදගත්කමක් ඇති හෝටල් සඳහා මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් අය කරනු ලබන ගාස්තුව 2022 මාර්තු 31 දින දක්වා ගෙවීමෙන් නිදහස් කිරීම.

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
2022.01.27	2022.01.27 දිනැති අංක 2264/28 හා අංක 2264/29 දරන ගැසට් නිවේදන - නීතිමය අවශ්‍යතාවය පූර්ණ කිරීම උදෙසා සුරාබදු ආඥා පනතේ (52 වන අධිකාරය) 32 වන වගන්තිය යටතේ අංක 08/2021 හා අංක 09/2021 දරන සුරාබදු නිවේදන 2021 දෙසැම්බර් මස 10 වන දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව දැනුම් දීම.
2022.05.04	සුරාබදු නිවේදන අංක 03/2022 (2022.04.29 දිනැති අංක 2277/62 දරන ගැසට් නිවේදනය) - ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලාභි යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ, ඉන් නිකුත් කරනු ලබන්නා වූ බෝතල් කරන ලද රා ලීටරයක් වෙනුවෙන් පනවනු ලබන බද්ද රු. 25/- සිට රු. 50/- දක්වා ඉහළ නැංවීම.
2022.06. 08	සුරාබදු නිවේදන අංක 04/2022 (2022.06.08 දිනැති අංක 2283/28 දරන ගැසට් නිවේදනය) - දේශීයව සපයනු ලබන හා ආනයනය කරනු ලබන එතිල් මධ්‍යසාර සඳහා අයකරනු ලබන සුරා බද්ද ඉහළ නැංවීම.
2022.07.28	සුරාබදු නිවේදන අංක 05/2022(2022.07.28 දිනැති අංක 2290/24 දරන ගැසට් නිවේදනය) - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සංචාරක ආයතන සඳහා මෘදු මත්පැන් බලපත්‍ර නිකුත්කිරීම
2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත	
2022.01.01	**2022 අංක 13 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත:** - මූල්‍ය සේවා මත වන එකතු කළ අගය මත වන බද්ද 15% සිට 18 % දක්වා වැඩි කිරීම සහ ඇතැම් භාණ්ඩ මත වන එකතු කල අගය මත බද්දෙන් නිදහස් කිරීම.
2022.06.01	2022.05.31 දිනැති අංක 2282/26 දරන ගැසට් නිවේදනය - එකතු කළ අගය මත බද්ද 8% සිට 12% දක්වා ඉහළ නැංවීම
2022.09.01	2022.08.31 දිනැති අංක 2295/08 දරන ගැසට් නිවේදනය - එකතු කළ අගය මත බදු අනුපාතය 12% සිට 15 % දක්වා ඉහළ නැංවීම
2022.10.07	2022.10.06 දිනැති අංක 2300/25 දරන ගැසට් නිවේදනය - සංයෝජිත සංකේතාංක අංක 9619.00.10 යටතේ සනීපාරක්ෂක තුවා සහ ටැම්පූන් ආනයනය සහ සැපයීම ශුන්‍ය අනුපාතයට යටත් කිරීම
2022 අංක 44 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත	
2022.10.01	- එකතු කළ අගය මත වන බදු ලියාපදිංචි සීමාව වසරකට මිලියන 300 සිට රුපියල් මිලියන 80 දක්වා අඩු කිරීම
2023.01.01	- සහාධිපත්‍ය නේවාසික මහල් නිවාස මත වැට් බදු නිදහස් කිරීම ඉවත් කිරීම.
වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු - 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත	

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
2022.01.06	2022.01.06 දිනැති අංක 2261/58 දරන ගැසට් නිවේදනය - 2020 ඔක්තෝම්බර් මස 26 දිනැති ගැසට් නිවේදන අංක 2199/2 සංශෝධනය කිරීම මඟින් රජයේ රෝහල් සහ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ප්‍රදානය කරනු ලැබූ වෛද්‍ය උපකරණ, යන්ත්‍රෝපකරණ ආදිය මත පනවා ඇති වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු නිදහස් කිරීම.
2022.01.12	2022.01.11 දිනැති අංක 2262/19 දරන ගැසට් නිවේදනය - අළුතින් නිර්මාණය කරන ලද ජාතික උපබෙදුම් සංයෝජිත සංකේතාංක සඳහා සහනදායී බදු අනුපාත සහ වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු නිදහස් කිරීම් නියම කිරීම.
2022.08.23	2022.08.22 දිනැති අංක 2294/26 දරන ගැසට් නිවේදනය - පරිත්‍යාග ලෙස ලැබෙන අත්‍යාවශ්‍ය භාණ්ඩ මත වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද නිදහස් කිරීම
2022.10.05	2022.10.05 දිනැති අංක 2300/13 දරන ගැසට් නිවේදනය - සනීපාරක්ෂක තුවා නිෂ්පාදන අමුද්‍රව්‍ය මත ගුවන් තොටුපළ බද්ද නිදහස් කිරීම
2023.01.01	2022.12.31 දිනැති අංක 2312/67 දරන ගැසට් නිවේදනය - 2017 රේගු සංයෝජිත සංකේතාංක අනුවාදය අඩංගු දැනට පවතින නියෝගය 2022 හි නව රේගු සංයෝජිත සංකේතාංක සංකේත අනුවාදය නැවත නිකුත් කිරීම
2003 අංක 25 දරන මුදල් පනත	
අපගමන බද්ද	
2022.03.27	2022.03.27 දිනැති අංක 2272/53 දරන ගැසට් නිවේදනය - කලාපීය ගමනාන්තයක් ලෙස සේවා සපයනු ලබන ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ලෙස ප්‍රවලිත කිරීමේ අරමුණු ඇතිව රත්මලාන කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙන් (CIAR) ශ්‍රී ලංකාවෙන් පිටවන ගුවන් මඟින් සඳහා අපගමන බද්ද සියයට 50 කින් ඇ.ඩො. 30 දක්වා අඩු කිරීම. -
2022.04.29	2022.04.29 දිනැති අංක 2277/63 දරන ගැසට් නිවේදනය - මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙන් (MRIA) නව ජාත්‍යන්තර ගුවන් සමාගම් විසින් මෙහෙයුම් ආරම්භ කළ දින වසර දෙකක කාලයක් සඳහා අපගමන බදු සහනය ලබාදීම. -
2022.12.09	2022.12.09 දිනැති අංක 2309/37 දරන ගැසට් නිවේදනය - වසර දෙකක් (02) සඳහා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සිට ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙක් සඳහාම අයකරනු ලබන ඇමරිකානු ඩොලර් 60 ක අපගමන බද්ද සම්පූර්ණයෙන් නිදහස් කිරීමට
2023.01.12	2023.01.11 දිනැති අංක 2314/16 දරන ගැසට් නිවේදනය

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
	- අපගමන බද්ද පනවන ලද 2003 වසරේ සිට මෙතෙක් නැව් මගින් පිටත්වන මගීන්ගෙන් අපගමන බද්ද අය කිරීමට නියමයන් පනවා නැත. එබැවින්, ගුවන් යානයකින් මෙන්ම නැවකින් ද ශ්‍රී ලංකාවෙන් පිටත්වන මගීන් සඳහා අපගමන බද්ද අයකිරීමට රෙගුලාසි හඳුන්වා දී ඇත.
2023.04.25	2023.04.25 දිනැති අංක 2329/19 දරන ගැසට් නිවේදනය 2023.11.11 දිනැති අංක 2314/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයේ I සටහනේ අංක ii අයිතමය සංශෝධනය කිරීම සඳහා
2004 අංක 11 දරන මුදල් පනත	
2023.01.01	2023.01.01 දිනැති අංක 2312/80 දරන ගැසට් නිවේදනය පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, විශේෂිත දුරකථන අංක STN පැමිණෙන දේශීය ප්‍රවේශ ගාස්තු ILAC විදුලි සංදේශ සංවර්ධන ගාස්තු TDC සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු OLAC සඳහා ගෙවිය යුතු බදු අනුපාතය 2023 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා තවත් වසර දෙකක් සඳහා දීර්ඝ කිරීම.
2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත	
2022.01.18	2022.01.18 දිනැති අංක 2263/03 දරන ගැසට් නිවේදනය - HCL ටෙක්නොලොජිස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් අපනයනය සඳහා තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය මගින් බලගැන්වූ සේවාවන් සැපයීම පිණිසවූ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ව්‍යාපෘතියට අදාළ තොරතුරු සහ ලබාදෙන ලද නිදහස් කිරීම් ප්‍රකාශයට පත් කිරීම.
2022.04.25	2022.04.25 දිනැති අංක 2277/02 දරන ගැසට් නිවේදනය - මංතිරු හතරක් උසැති අධිවේගී මාර්ගයක් නව කැළණි පාලම සිට අතුරුගිරිය හරහා රාජගිරිය තෙක් ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති අදාළ තොරතුරු සහ නිදහස් කිරීම් ප්‍රකාශයට පත් කිරීම
2022.08.03	2022.08.03 දිනැති අංක 2291/25 දරන ගැසට් නිවේදනය අපනයනය සඳහා මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවාවන් සංවර්ධනය කිරීම සඳහා HCL තාක්ෂණ ලංකා පුද්ගලික ආයතනය මගින් ව්‍යාපෘතිය සඳහා ලබාදී ඇති තොරතුරු සහ නිදහස් කිරීම් ප්‍රකාශයට පත් කිරීම
2010 අංක 17 දරන කැසිනෝ නියාමන පනත	
2022.08.31	2022.08.31 දිනැති අංක 2295/10 දරන ගැසට් නිවේදනය -2022 අංක 01 කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර රෙගුලාසිය ප්‍රකාශයට පත් කිරීම
2022.09.01	2022.08.31 දිනැති අංක 2295/09 දරන ගැසට් නිවේදනය

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
	-2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර පනතේ 2 වැනි වගන්තිය යටතේ නිකුත්කර ඇති බලපත්‍රයේ දක්වා ඇති පරිදි කැසිනෝ ව්‍යාපාරයේ නියැලීම සඳහා නිශ්චිත වූ ප්‍රදේශය කැසිනෝ ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය හෝ පරිශ්‍රය විය යුතුය.
1989 අංක 13 දරන විශේෂ විධිවිධාන පනත	
2022.07.27	2022.07.27 දිනැති අංක 2290/19 දරන ගැසට් නිවේදනය -දේශීයව එකලස් කරන ලද හෝ නිෂ්පාදිත වාහන සඳහා අදාළ සහනදායී නිෂ්පාදන බදු අනුපාතිකයේ බදු පදනම ගෙවිය යුතු තීරු බදු ප්‍රතිශතය වෙනුවට CIF අගයෙන් සියයට ප්‍රතිශතයක් ලෙස සංශෝධනය කිරීම
2023.01.01	2022.12.31 දිනැති අංක 2312/68 දරන ගැසට් නිවේදනය -2023 ජනවාරි 01 දිනි සිට බලපැවැත්වෙන පරිදි ලෝක අභිරුචි සංවිධානයේ අනුවාදයෙන් අලුතින් පිහිටුවන ලද HS පද්ධතිය ඇතුළත් කිරීම.
2022.12.31	2022.12.31 දිනැති අංක 2312/68 දරන ගැසට් නිවේදනය -පෙට්‍රල් සහ ඩීසල් මත වන නිෂ්පාදන බදු අනුපාතය ලිටරයකට රු. 25 කින් වැඩිකිරීම.
2022 අංක 45 දරන දේශීය ආදායම් සංශෝධන පනත	
ආයතනික ආදායම් බද්ද	
2022.10.01	සම්මත ආදායම් බදු අනුපාතය 30% මත්පැන්, දුම්කොළ, ඔට්ටු ඇල්ලීම සහ සූදු ව්‍යාපාර සඳහා අදාළ වන ආදායම් බදු අනුපාතය 40%
පුද්ගල ආදායම් බද්ද	
2023.01.01	වාර්ෂික බදු ආදායම මූලික 1,200,000 නිදහස් 500, 000 -1,000,000 6% 1,000,000 - 1,500,000 -12% 1,500,000 - 2,000,000 -18% 2,500,000 - 3,000,000 - 24% 3,000,000 - 3,500,000 - 30% 3,500,000 ට වැඩි -36%

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
රඳවාගැනීමේ බද්ද	
2023.01.01	**රඳවාගැනීමේ බදු අනුපාතික**
	ලාභාංශ 15% පොලිය හෝ වට්ටම් 5% රු.100,000 ඉක්මවන කුලිගෙවීම් 10% රු. 100,000 ඉක්මවන සේවා ගෙවීම් 5% අනෙකුත් සියළු කටයුතු 14%
2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ (විධිවිධාන) පනත	
2022.12.31	2022.12.31 දිනැති අංක 2312/73 දරන ගැසට් නිවේදනය - රජය පාර්ශවකරුවෙකු වන ගිවිසුමකට අනුව කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව විසින් ඉඩමක් බදු දීමක් සම්බන්ධයෙන්, බදු වාරිකය සහ/හෝ කල්බදු කුලිය/ප්‍රතිෂ්ඨාව, බදුකරු විසින් අදාළ වන පරිදි කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවට මුදලින් ගෙවිය යුතු නොවන අවස්ථාවක, එවැනි බදු දීමකට අදාළ ඕනෑම සාධනපත්‍රයක් මත වන මුද්දර ගාස්තුව ගෙවීමෙන් නිදහස් කිරීම.
2018 අංක 35 දරන මුදල් පනත මෝටර් රථ සඳහා සුඛෝපභෝගී බද්ද	
2023.01.01	2022.12.31 දිනැති අංක 2312/69 දරන ගැසට් නිවේදනය -2017 රේගු සංයෝජිත සංකේතාංක අනුවාදය අඩංගු දැනට පවතින නියෝගය 2022 හි නව රේගු සංයෝජිත සංකේතාංක සංකේත අනුවාදය නැවත නිකුත් කිරීම
2023.02.11	2023.02.10 දිනැති අංක 2318/53 දරන ගැසට් නිවේදනය සම්පූර්ණ විදුලි වාහනවල බදු නිදහස් සීමාව රු. මිලියන 6 සිට රු. විදුලි මෝටර් රථ ආනයනය කරන සංක්‍රමණික සේවකයන් සඳහා මිලියන 12ක් දක්වා ඉහල නැංවීම.

අභියෝග හා අනාගත ඉලක්ක

1. දැනට පවතින ආර්ථික අර්බුධය හමුවේ වුව ද, තිරසර ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම සඳහා ඵලදායී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.

2. රාජ්‍ය ණය තිරසර මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.

3. රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයට සමාන ආර්ථිකයන් හා සැසඳිය හැකි වන සේ රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්ති සහ ප්‍රධාන ආදායම් එකතු කිරීමේ ආයතන සඳහා ආයතනික ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම

4. හිතකර බදු පරිපාලනයක් සහ බදු අනුකූලතාවයක් සහතික කිරීම.

ආචාර්ය එම්.කේ.සී. සේනානායක
අධ්‍යක්ෂ ජනරාල්

3.0 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිල්-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022		සටහන	තක්ෂ 2022	2021	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා එක බදු	2	-	5,820	ඒසිල්-1
-	ජාතාන්තර වෙළඳාම් එක බදු	3	-	-	
31,000,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	3,007,245,202	15,011,741,716	
31,000,000,000	මුළු ආදායම් ලැබීම් (අ)		3,007,245,202	15,011,747,536	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අණුව		68,826,000	55,722,000	ඒසිල්-3
-	නැන්පතු		97,518	85,563	ඒසිල්-4
-	අන්තිකාරම් ගිණුම්		2,552,473	3,862,271	ඒසිල්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		71,475,991	59,669,834	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		3,078,721,193	15,071,417,369	
	භාණ්ඩාගාරයට ශ්‍රේෂණ (ඇ)		4,000,000	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		3,074,721,193	15,071,417,369	
	අඩු කළා : වියදම්				
-	ස්ථානාවර්තන වියදම්		-	-	
48,765,000	වැටුප්, වෙතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	43,817,117	40,014,942	
30,729,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	24,694,819	16,101,139	ඒසිල්-2(ii)
930,000	සභානාථාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	539,392	639,272	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් ස්ථානාවර්තන වියදම්	9	-	-	
80,424,000	මුළු ස්ථානාවර්තන වියදම් (උ)		69,051,328	56,755,353	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් ස්ථානරුන්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
485,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	215,500	3,772,049	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිල්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
196,000	හැකියා වර්ධනය	14	196,000	191,000	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
681,000	මුළු මූලධන වියදම් (ඌ)		411,500	3,963,049	
	නැන්පතු ගෙවීම්		83,301	102,000	ඒසිල්-4
	අන්තිකාරම් ගෙවීම්		2,353,003	3,919,482	ඒසිල්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		2,436,304	4,021,482	
	මුළු වියදම් ඔ = (උ+ඌ+ඌ)		71,899,132	64,739,884	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-ඔ)		3,002,822,061	15,006,677,486	
	අනුව සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		3,002,822,061	15,006,677,486	ඒසිල්-7
	දෙසැම්බර් 31 දිනට අනුව ශේෂය		-	-	ඒසිල්-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-8

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	34,227,117	32,634,417
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	6,914,411	7,113,881
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		41,141,529	39,748,298
ඉද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		6,875,231	7,088,918
දේපළ පිරියත හා උපකරණ සංචිතය		34,227,117	32,634,417
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	39,180	24,963
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		41,141,529	39,748,298

පිටු අංක 07 සිට 28 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 29 සිට 34 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : කේ.එම්. මහින්ද සිරිවර්ධන
තනතුර : ලේකම්
දිනය : 2023.02. 22

.....
ගණන්දීමේ නිලධාරී
නම : ආචාර්ය එම්. කේ. සී. සේනානායක
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2023.02. 22

.....
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
නම : ජේ.එම්.ඊ. ජයසුන්දර
දිනය : 2023.02. 22

ජේ.එම්.ඊ. ලක්මිණී ජයසුන්දර
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

තත්‍ය

	2022	2021
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	2,365,283	2,241,765
අග්‍රිම ලැබීම්	68,826,000	55,722,000
අත්තිකාරම් අයකර ගැනීම්	2,465,366	2,045,841
තැන්පතු ලැබීම්	97,518	85,563
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	73,754,167	60,095,168
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	66,367,091	54,177,176
සහනාධාර සහ මාරුකිරීම්	539,392	639,272
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	4,000,000	-
අත්තිකාරම් ගෙවීම්	2,353,003	1,405,721
තැන්පතු ගෙවීම්	83,301	102,000
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	73,342,787	56,324,169
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	411,380	3,770,999
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොලී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	120	1,050
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	120	1,050
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	411,500	3,772,049
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	411,500	3,772,049
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(411,380)	(3,770,999)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

සටහන් අංක 1,2,3,4

ඒසිඒ -1

ආදායම් ගණන් දීමේ නිලධාරි : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය : 238

රු.

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	සටහන	ආදායම් ඇස්තමේන්තුව (1)		ආදායම් රැස්කිරීම (2)			(3)	ආදායමෙන් ආපසු ගෙවීම් (4)			(5)
			මූලික ඇස්තමේන්තුව	සංශෝධිත ඇස්තමේන්තුව	අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් රැස්කිරීම්	වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම් (SA-21)	එකතුව	හිඟ ආදායම් රැස්කිරීම්	මුදලින්	වැරදි නිවැරදි කිරීම්	එකතුව	ශුද්ධ ආදායම
			1(i)	1(ii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	(3)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=2(iii)+(3)-4(iii)
	<u>දේශීය භාණ්ඩ හා සේවා මත බද්ද</u>	2										
1002.10.00	සමාජ වගකීම් බද්ද		-	-	-	-	-	-	-	-	-	-
	දේශීය භාණ්ඩ හා සේවා මත මුළු බදු ආදායම		-	-	-	-	-	-	-	-	-	-
2005	වර්තන පැවරීම්		25,000,000,000	31,000,000,000	-	3,007,245,202	3,007,245,202	-	-	-	-	3,007,245,202
2005.01.00	මහ බැංකුවේ ලාභ		25,000,000,000	31,000,000,000	-	3,007,245,202	3,007,245,202	-	-	-	-	3,007,245,202
	අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම (ආ)		25,000,000,000	31,000,000,000	-	3,007,245,202	3,007,245,202	-	-	-	-	3,007,245,202
	මුළු බදු නොවන ආදායම (අ) + (ආ)		25,000,000,000	31,000,000,000	-	3,007,245,202	3,007,245,202	-	-	-	-	3,007,245,202
	මුළු ආදායම (සටහන් 1 - 4)		25,000,000,000	31,000,000,000	-	3,007,245,202	3,007,245,202	-	-	-	-	3,007,245,202

* තම වාතාර්කරණ ආයතනයට අදාළ ආදායම් සංකේත පමණක් ඇතුළත් කළ යුතු ය.

සටහන් අංක 5,6,7,8,9,10,11,12,13,14,15

ඒසිඒ-2(ii)

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යදම් ප්‍රකාශය

ම ශ්‍රේෂ්ඨ අංකය : 238

රු.

වැය විෂයය	සටහන	ප්‍රතිපාදනය					ව්‍යදම			ඉද්ධ බලපෑම		
		මූල්‍යකරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම් (3) (-)/+	මුළු ඉද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුදල් පොතට අනුව ව්‍යදම (5)	මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු විසින් දැරූ ව්‍යදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6)	මුළු ව්‍යදම (7)=(5)+(6)	ඉතිරිය / (ඉක්මවීම්) (8)=(4)-(7)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100	වෙනස්කම්වලට හේතු
<u>රාවර්තන ව්‍යදම්</u>		II										
විෂය අනුව වර්ගීකරණය න ලද වැටුප්, වේතන සහ ෘකුත් සේවක ප්‍රතිලාභ	5											
<u>ල පඩිනඩි</u>			47,100,000	-	1,665,000	48,765,000	43,752,567	64,550	43,817,117	4,947,883		
I වැටුප් හා වේතන			26,000,000		1,665,000	27,665,000	27,204,372	-	27,204,372	460,628	1.67	5% ට අඩු ප්‍රතිශතයකි

002 අතිකාල හා නිවාඩු දින ටුප්			1,900,000		-	1,900,000	891,801	-	891,801	1,008,199	53.06	අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාවට නැංවීම මඟින් අතිකාල දීමනා පාලනය කර වියදම් නාකරීකරණය කිරීම.
003 වෙනත් දීමනා			19,200,000		-	19,200,000	15,656,394	64,550	15,720,944	3,479,056	18.12	අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාවට නැංවීම මඟින් 1/3 දීමනා පාලනය කර වියදම් නාකරීකරණය කිරීම.
ය විෂය අනුව වර්ගීකරණය රන ලද අනෙකුත් භාණ්ඩ ා සේවා	6											
<u>ඉන් වියදම්</u>	-											
101 දේශීය			200,000		-	200,000	184,700	-	184,700	15,300	7.65	දේශීය ගමන් වියදම් අඩුකිරීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාවට නැංවීම.
102 විදේශීය			4,140,000		300,000	4,440,000	4,358,035	-	4,358,035	81,965	1.85	
කතුව (අ)			**4,340,000**	**-**	**300,000**	**4,640,000**	**4,542,735**	**-**	**4,542,735**	**97,265**		
<u>ැපයීම්</u>	-											
201 ලිපිද්‍රව්‍ය හා කායර්ාලීය වශ්‍යතා			1,800,000		505,000	2,305,000	2,031,711	-	2,031,711	273,290	11.86	ආනයන සීමා හේතුවෙන් අපේක්ෂා කල ලිපි ද්‍රව්‍ය ලබා ගැනීමට නොහැකි වීම.
202 ඉන්ධන			5,080,000		1,900,000	6,980,000	5,444,741	-	5,444,741	1,535,259	22.00	මු.රෙ 66 අනුමත කිරීමෙන් පසු ප්‍රතිශෝධිත අයවැය මඟින් අමතර ප්‍රතිපාදන ලබා දීම.
203 ආහාර පාන හා නිල ැලුම්			60,000		(20,000)	40,000	40,000	-	40,000	-	-	
කතුව (ආ)			**6,940,000**	**-**	**2,385,000**	**9,325,000**	**7,516,452**	**-**	**7,516,452**	**1,808,548**		
ඩන්තු වියදම්	-											
301 වාහන			2,000,000		-	2,000,000	1,645,633		1,645,633	354,367	17.72	අපේක්ෂිත වියදම් දැරීමට සිදු නොවීම.

? යන්ත්‍ර සහ න්ත්‍රෝපකරණ			400,000		(295,000)	105,000	58,522		58,522	46,478	44.26	අපේක්ෂිත වියදම් දැරීමට සිදු නොවීම.
